සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Second Term Test – January 2022

දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1 hour

| 54 | S | I |
|---|---|---|

## Oriental Music – I

## පෙරදිග සංගීතය – I

Name :- ................................................. Grade : -................ Index number:-....................

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- ප්‍රශ්න සියල්ලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුත්තේ ලබා දෙන පිළිතුරු පත්‍රයේ පමණි.
- වඩාත් නිවැරදි පිළිතුරට හිමි වරණයට තෝරා (x) ලකුණ යොදන්න.
- අපහැදිලි පිළිතුරු කපාහරිනු ලැබේ.

01. ම ග ම රි - - ස - - ග රි - - ග ප - - ආදී වශයෙන් ස්වර සංගතියක් සකස් විය හැකි රාගය කුමක් ද?

(1) යමන් (2) බිලාවල් (3) කාෆි (4) භූපාලි

02. තාල සලකුණු සමානත්වයකින් යුක්ත, ඔබ නිර්දේශිත තාල දෙකකි.

(1) කෙම්ටෝ -දාදරා (2) ලාවනී-කෙහෙර්වා
(3) දාදරා- ලාවනී (4) කෙහෙර්වා-ජප්

03. ක , තිං , තා , ධිං , තිං යන අවනද්ධාක්ෂර,

(1) ගැටබෙරයේ වයයි (2) මද්දලයෙන් වයයි
(3) තම්මැට්ටමෙන් වයයි (4) තබ්ලාවෙන් වයයි

04. සේනානායක වේරලියද්ද මහතා ගායනය කරන, "පුංචි දඟකාරියේ" ගීතයට කුමන රාගයක ඡායාවක් වැටී ඇත්ද?

(1) බිලාවල් 2) භූපාලි (3) භෛරවී (4) යමන්

05. ලූෂන් බුලත්සිංහල මහතාගේ "තාරාවෝ ඉගිලෙති " නාට්‍යයේ සංගීත අධ්‍යක්ෂණයෙන් දායක වී ඇත්තේ,

(1) රෝහණ බැද්දගේ මහතා ය. (2) ගුණදාස කපුගේ මහතා ය.
(3) රොඩ්නි වර්ණකුල මහතා ය. (4) ලූෂන් බුලත්සිංහල මහතා ය.

06. තිත් ක්‍රම දෙකක් ඇසුරු කර ගනිමින් ගායනා කෙරෙන වන්නමකි.

(1) කොවුලා වන්නම (2) උකුසා වන්නම
(3) සින්දු වන්නම (4) තිසරා වන්නම

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

07. තෝඩායම, ඉන්නිසය වැනි කොටස් දක්නට ලැබෙනුයේ,

(1) සොකරි නාටකයේය. (2) කෝලම් නාටකයේය.

(3) නූර්ති නාටකයේය. (4) නාඩගම් නාටකයේය.

08. D Major chord එකට අයත් ස්වර වනුයේ,

(1) D F G (2) D G B (3) D G A (4) D E C

09. ශ්‍රී ලාංකේය චිත්‍රපට කර්මාන්තයේ ආරම්භය සනිටුහන් වූයේ වර්ෂ,

(1) 1935 (2) 1947 (3) 1932 (4) 1943

10. දරු නැළවිලි ගී නාදමාලා ඇසුරින් සකස් වූ සරල ගීතයක් වන "ආදරයේ උල්පත වූ අම්මා......" යන ගීතයේ තනු නිර්මාණය කර ඇත්තේ,

(1) ප්‍රේමකීර්ති ද අල්විස් මහතා ය. (2) රෝහණ වීරසිංහ මහතා ය.

(3) වික්ටර් රත්නායක මහතා ය. (4) ඩබ් ඩී අමරදේව මහතා ය.


A


B


C


D

ඉහත රූප සටහන් ඇසුරින් ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

11. A භාණ්ඩයෙන් ශිල්පීය දක්ෂතා විදහා දැක්වූ සුප්‍රසිද්ධ වාද්‍ය ශිල්පියෙකි,

(1) හාත්ඛණ්ඩේ පඬිතුමා. (2) අමීර් ඛුෂ්රු පඬිතුමා.

(3) රවිශංකර් පඬිතුමා. (4) තාගෝර් පඬිතුමා.

12. ස්වර පිහිටීම අතින් සමාන සංගීත භාණ්ඩ දෙකකි.

(1) A B (2) B C (3) C D (4) A C

13. ඉහත භාණ්ඩ අතුරින් තත් සයකින් යුක්ත සංගීත භාණ්ඩයකි.

(1) A (2) B (3) C (4) D

14. සාමාජිකයන් සතර දෙනෙකු සහිත සංගීත භාණ්ඩ පවුලක කුඩාම සාමාජිකයා මෙම භාණ්ඩ අතර ඇත. එය,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

15. බාජ්කා තාර් යනුවෙන් ප්‍රධාන තත නම් කරනුයේ මේ අතරින් කිනම් භාණ්ඩයේ ද?

(1) A (2) B (3) C (4) D

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

16. "උඩු නියරෙන් වැටී ගෙනේ......" මෙම ජන ගීය,

(1) කමත් ගීය කි. (2) නෙලුම් ගීය කි.
(3) නැලවිලි ගීය කි. (4) පන් නෙලීමේ ගීය කි.

17. ජයදේව විසින් රචිත "ගීත ගෝවින්දය" නම් ග්‍රන්ථයෙහි ඇතුලත් කාව්‍ය _______ ලෙස ගයා ඇත.

(1) භජන් ගී (2) කව්වාලි ගී (3) වංග ගී (4) ගසල් ගී

18. "බුද්ධං සරණේ සිරස දරාගෙන " මෙම පැදි පාදයේ ඇති ගී මත් ගණන වනුයේ,

(1) 16 කි. (2) 24 කි. (3) 14 කි. (4) 12 කි.

19. 𝅗𝅥. බටහිර සංගීතයේ භාවිතා වන මෙම සංකේතයේ මුළු වටිනාකම.

(1) මාත්‍රා 3 කි. (2) මාත්‍රා 1 1/2 කි. (3) මාත්‍රා 6 කි. (4) මාත්‍රා 3/4 කි.

20. වාද්‍ය ශිල්පීන් මුහුණට මුහුණ ලා වාඩි වී, එකම ආකාරයේ තාල වාද්‍ය භාණ්ඩ දෙකක් වාදනය කරමින් නාට්‍ය සඳහා තාලය සපයයි.
මෙසේ කියවෙන්නේ කුමන නාට්‍ය ශෛලියක් සඳහා ද?

(1) නූර්ති (2) කෝලම් (3) සොකරි (4) නාඩගම්

21. විවිධ ශිල්ප ක්‍රම භාවිතා කරමින් විශිෂ්ඨ වූ සංගීත නිර්මාණයක් සිදුකල සත් සමුදුර චිත්‍රපටයේ සංගීත අධ්‍යක්‍ෂවරයා,

(1) පණ්ඩිත් අමරදේව ය. (2) මහාචාර්ය සිරි ගුණසිංහ ය.
(3) සංගීත ශිල්පී සෝමදාස ඇල්විටිගල ය. (4) මහගම සේකරයන් ය.

22. |ස - -| - - -| මෙවැනි ස්වර ප්‍රස්තාරයන්, බටහිර සංගීත ප්‍රස්තාර කිරීමට අනුව සටහන් කිරීමේ දී, මෙම මාත්‍රා ඇදීම සඳහා යොදාගත හැකි සංකේතය කුමක් ද?

(1) Tie Mark (2) Rest Mark (3) Key Signature (4) Time Signature

23. සරල තනු වලින් සමන්විතය. ඒකාකාරී තනු රටා ඇත. වේග රිද්මයට අනුව ගායනය කරන අතර ගායනය අතරතුර සරල නර්තනයක් ද විය. ක්‍රමයෙන් වේගය වැඩි කිරීම සිරිතය.
ඉහත විස්තරය ඇතුළත් ගීත ශෛලිය වනුයේ,

(1) කණ්ඩායම් ගී (2) කපිරිඤ්ඤා ගී
(3) බෙංගාලි ගී (4) ගසල් ගී

24. ජන සංගීතය, නිර්මාණ සංගීතය සඳහා ආශ්‍රය කරගත හැකි අයුරු ප්‍රායෝගිකව පෙන්වා දුන්, "සඳසාවී මා" ආදී ගීත නිර්මාණය කරන ලද සංගීත ශිල්පියෙකි,

(1) සී ද එස් කුලතිලක මහතා. (2) ලයනල් රන්වල මහතා.
(3) ඩබ්ලිව් බී මකුලොලුව මහතා. (4) රෝහණ බැද්දගේ මහතා.

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

25. එකම ශ්‍රැතියකට සුසර කළ සංගීත භාණ්ඩ කිහිපයකින් යම් ස්වරයක් වාදනය කරන විට, එකවර හඬ නිකුත් වුව ද, එම භාණ්ඩ එකිනෙක වෙන්කොට හඳුනාගත හැකි වනු ඇත. මෙය නාදයේ ඇති එක්තරා ගුණයක් නිසා සිදුවන්නකි. එම ගුණය වනුයේ,

(1) ජාති භේදය (2) රූප භේදය (3) උච්චනීච භේදය (4) නාද භේදය

26. පරිගණකය හා යතුරු පුවරුව ආශ්‍රයෙන් කරනු ලබන සංගීත නිර්මාණ ගෝත්‍ර හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

(1) E-Music (2) MIDI File (3) Software (4) Website


27. ස රි ස ධ , නි ස රි ස මෙම ස්වර සංගීතය කුමන රාගයකට අයත් දැයි හඳුනාගෙන, එම රාගයේ වාදී සංවාදී ස්වර තෝරන්න.

(1) ම, ස (2) ප, ස (3) ග, නි (4) ග, ධ

28. රබින්ද්‍ර සංගීතය ඇසුරුකර ගනිමින් සරල ගී තනු සකස් කර ඉතා මියුරු ගීත රසයක් ශ්‍රාවක ජනතාවට ලබාදුන් දක්ෂ සංගීතඥයෙකි,

(1) ඔස්ටින් මුණසිංහ මහතා. (2) සරත් දසනායක මහතා.

(3) රෝහණ වීරසිංහ මහතා. (4) ආනන්ද සමරකෝන් මහතා.




මෙම රූප සටහනේ කරුණු ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

29. $C^m$ Chord එකට අදාල ස්වර සඳහා යොදාගත හැකි අංක මොනවා ද?

(1) 1, 5, 8 (2) 6, 9, 12 (3) 1, 4, 8 (4) 1, 4, 6

30. E Chord එක වාදනය කිරීම සඳහා යොදාගත යුතු විකෘති ස්වරයට අංක වනුයේ,

(1) 7 (2) 9 (3) 11 (4) 4

31. බටනලාවක _______ දක්වා ස්වර පරාසයක් වාදනය කළ හැකිය.

(1) මන්ද්‍ර පංචමයේ සිට උච්ච ෂඩ්ජය දක්වා.

(2) මන්ද්‍ර මධ්‍යමයේ සිට උච්ච පංචමය දක්වා.

(3) මන්ද්‍ර පංචමයේ සිට උච්ච මධ්‍යමය දක්වා.

(4) මන්ද්‍ර පංචමයේ සිට උච්ච පංචමය දක්වා.

32. ගීතයක් ගායනය කරන අතරතුර එම පදවලට යටින් ගලාගෙන යන සංගීත භාණ්ඩ ඇතැම් ගීතවල නිර්මාණය කර ඇත. මෙම භාණ්ඩ හඳුන්වනුයේ,

(1) Bits (2) Interlude (3) Counter (4) Introduction

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

33. කර්ණාටක සංගීතය භාවිතා කරන නාට්‍ය ශෛලියකි,
(1) සොකරි (2) නාඩගම් (3) නූර්ති (4) කෝලම්

34. ද්‍රවිඩ අනුකරණයෙන් මිදී ස්වතන්ත්‍ර තනු නිර්මාණය කරමින් අප රටට ආවේනික සිංහල ලකුණ තැබූ චිත්‍රපට වන්නේ,
(1) රේඛාව (2) රන්මුතු දූව
(3) කඩවුණු පොරොන්දුව (4) සත් සමුදුර

35. සළකුණු යොදා නැතත්, ඇතැම් ස්වර ඛණ්ඩ හොඳින් නිරීක්ෂණය කළ විට එහි යම් රාගයක ලක්ෂණ ඇති බව දැකිය හැක. ඒ අනුව පහත දී ඇති ස්වර ඛණ්ඩ අතුරින් බිලාවල් රාගයට අදාල ස්වර ඛණ්ඩය තෝරන්න.
(1) ග රි, ග ප ධ ස - - - ධ ප - - ග රි - - ස -
(2) නි̣ ස ග, ම ග රි, (ග) ම රි ස - - -
(3) නි̣ රි ග, රි ග, රි, නි̣ රි ස -
(4) ග ප - - ම ග - - (ම) රි - ස රි - - ස -

36. මෙම රාග දෙක එකම ථාඨයකින් උපදී. රාග දෙකම ගායනයට සුදුසු වන්නේ එකම කාල පරාසය තුලය. මෙම රාග දෙක වනුයේ,
(1) බිලාවල් - භූපාලි (2) භූපාලි - යමන්
(3) බිලාවල් - යමන් (4) කාෆි - භූපාලි

37. ප්‍රධාන තත මන්ද්‍ර මධ්‍යමයට සුසර කරන සංගීත භාණ්ඩ යුගලයකි.
(1) සිතාර් - එස්රාජ් (2) සිතාර් - වයලින්
(3) එස්රාජ් - ගිටාර් (4) ගිටාර් - වයලින්

38. මුල් යුගයේ ගුවන් විදුලියෙන් ප්‍රචාරය වූ ගී අතර, ඉතා ජනප්‍රිය ගීතයක් වන “ඇසේ මධුර ජීවනයේ ගීතා..........” නම් ගීතය, නිර්මාණය කළ සංගීතඥයා කවුද?
(1) සුනිල් ශාන්ත (2) ඩබ්ලිව්. ඩී අමරදේව
(3) ආනන්ද සමරකෝන් (4) එච්. ඩබ් රූපසිංහ

39. දක්ෂ ඉන්දියානු බටනලා වාද්‍ය ශිල්පියෙකු ලෙස _______ නම් කළ හැක.
(1) ජග් ජිත් සිං (2) ශබීර් හුසේන්
(3) අමීර් ඛුෂ්රු (4) හරි ප්‍රසාද් චෞරසියා

40. සංගීතයේ ස්වර ඉහළ පහළ වීමට සංඛ්‍යාතයේ අඩු වැඩි බව බලපාන බව ඔබ උගෙන ඇත. එසේ සංඛ්‍යාතය වැඩි වනවිට තරංග ආයාමය ද වෙනස් වේ. මෙය නාදයේ කවර ගුණයක් ද?
(1) ධ්වනි ගුණය (2) විපුල තාවය (3) තාරතාවය (4) රූප භේදය

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 11 – Second Term Test – January 2022**

දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time :2 hours**

| 54 | S | II |
|---|---|---|

# Oriental music – II
# පෙරදිග සංගීතය – II

Name :- .................................................... Grade : -................ Index number:-....................

01. (i) ජප් තාලයට අදාලව පද බෙදෙන ගීතයක පාදයක් අදාල තාලයට අනුව පද ප්‍රස්තාර කරන්න.

(ii) සිතාරය වාදනය කරන උපකරණය නම් කරන්න.

(iii) කුණ්ඩලකේහි නම් නව නාට්‍යයේ සංගීත අධ්‍යක්ෂණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(iv) මධ්‍යමය සහ නිශාධය වර්ජිත වන ඔබ නිර්දේශිත රාගය කුමක් ද?

(v) වංග ගීත ශෛලියේ නිර්මාතෘවරයා නම් කරන්න.

(vi) ජනප්‍රිය ද්‍රවිඩ ගීතයක් වන “චින්න චින ආසෙයි..........” ගීතයේ සංගීත නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(vii) | ජේංකි තංකි | තංකි තංකි | යන බෙර පදය වාදනය කිරීමට සුදුසු බෙරය නම් කරන්න.

(viii) රෝහණ බැද්දගේ මහතා ගායනා කරන “මල්සරා බැල්ම හෙලා ” යන ගීතයට පාදක වී ඇති ජන ගීය නම් කරන්න.

(ix) “කොයි යන්නට එනවද බොල .....” යන ගීතය _______ මහතාගේ _______ නාට්‍යයේ ඇතුලත් වී ඇත.

(x) “ස්වර්ණ ප්‍රදීපාය මාන.....” නම් ගීතයේ_______ රාගයේ ඡායාව ඇති අතර එම ගීතය, _______ විසින් ගායනා කරයි.

(ලකුණු - 12)

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

02.

| A | B | C |
|---|---|---|
| සම්පූර්ණ ජාති රාගයකි. | සම්පූර්ණ ජාති රාගයකි. | එක් විකෘති ස්වරයන් යෙදේ. |
| ඇතැම් විට ශුද්ධ නිශාධය යොදා ගනී. | සප්තකයේ ඇති ස්වර දොලසම යොදාගත හැක. | රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයේ. |
| රාත්‍රී තෙවන ප්‍රහරයේ ගායනයට සුදුසු වේ. | භක්ති රසයෙන් පිරිපුන් රාගයකි. | සම්පූර්ණ ජාති රාගයකි. |

(i) ඉහත A, B, C කොටස් යටතේ විස්තර කර ඇති රාග හඳුනාගෙන එකිනෙක වෙන්වෙන්ව නම් කරන්න. (ලකුණු - 03)

(ii) A රාගයට අදාල මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායී කොටස නියමිත තාල සලකුණු සහිතව ලියා ඊට අදාල තානාලංකාර දෙකක් ලියන්න. (ලකුණු - 05)

(iii) B සහ C රාගයන්හි මුඛ්‍යාංග සහ එම රාගයන්ගේ ඡායාව ගැබ් වී ඇති සරල ගීත එක බැගින් නම් කරන්න.

| B රාගය | | C රාගය | |
|---|---|---|---|
| මුඛ්‍යාංගය | - | මුඛ්‍යාංගය | - |
| ගීතය | - | ගීතය | - |

(ලකුණු - 04)

03.

| ප ප | ධ - | - +ධ‍ | ම - |
|---|---|---|---|
| ග ම | ගම ගරි | ස - | - - |

(i) ඉහත දී ඇති ප්‍රස්තාරය බටහිර ක්‍රමයට පෙරලා ලියන්න. (ලකුණු - 04)

(ii) එම ප්‍රස්තාරය සඳහා උචිත හින්දුස්තානී තාල පදය නියමිත තාල සලකුණු සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු - 02)

(iii) ස්වර පුවරුවක රූප සටහනක් ඇඳ F Major Scale එක ලකුණු කර පෙන්වන්න. (ලකුණු - 04)

(iv) කාෆි රාගයේ ආරෝහණ ස්වර G Major Scale ට අනුව ලියා දක්වන්න. (ලකුණු - 02)

04. (i) නූර්ති හා නාඩගම් නාට්‍ය ශෛලීන් අතර සම විෂමතා දෙක බැගින් ලියන්න. (ලකුණු - 04)

(ii) ඔබ දන්නා ප්‍රචලිත නූර්ති නිෂ්පාදකවරයෙකු <u>නම් කර</u> ඔහුගේ නූර්ති ගීතයක ස්ථායී කොටස ලියා දක්වන්න. (ලකුණු - 04)

(iii) සරච්චන්ද්‍ර ශූරීන් විසින් ආරම්භ කරන ලද නව නාට්‍ය කලාවට ඉපැරණි නාඩගම්වල ආභාෂය ලැබුණු අයුරු විදහා දැක්වෙන කරුණු දෙකක් ලියන්න. (ලකුණු - 02)

(iv) ඉහත (iii) හා බැඳි <u>නාඩගම් ගීය</u> හා ඊට අනුරූපී වන <u>නව නාට්‍ය ගීතයක්</u> නම් කරන්න. (ලකුණු - 02)

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

05. (i) නාදයකත්, ශබ්දයකත් අතර පවතින වෙනස කෙටියෙන් පහදා, නාද තරංගයක් හා ශබ්ද තරංගයක් රූප සටහනක් මගින් පෙන්වන්න. (ලකුණු - 03)

(ii) නාදයේ ත්‍රිවිධ භේදය රූප සටහන් හා උදාහරණ ඇසුරින් පහදන්න. (ලකුණු - 06)

(iii) ෂඩ්ජය, මධ්‍යමය, පංචමය යන ස්වරවල සංඛ්‍යාත පිළිවෙලින් ලියන්න. (ලකුණු - 03)

06. A - මෝරා .... බීජයෙනා ......

B - ඉන්නේ දුම්බරයි මහ කලු ගලක් යට ......

C - වරමති සුබ චරිතේ ......

D - නුබේ අම්මා කොතැන ගියා ......

E - රිදියෙන් තනලා රත්රන් ඔපලා ......

F - නොමදින් විකුම් පාලා ......

(i) ඉහත A සිට F දක්වා දී ඇති පැදි පාද ගැමි ගී හා සේ ගී යටතේ වගු ගත කරන්න. (ලකුණු - 03)

(ii) ගැමි ගී හා සේ ගී අතර ඇති වෙනස්කම් හතරක් ලියන්න. (ලකුණු - 04)

(iii) ඉහත දක්වා ඇති සේ ගී අතුරින්, එක් වර්ගයක් පිළිබඳ ඔබ දන්නා කරුණු 5ක් ලියන්න. (ලකුණු - 03)

07. (i) "සේවිත පාද සරෝරුන සන්ජිත ......." යනු ඔබ උගත් වන්නම ගී පාදයක් වේ. මෙම ගී පාදය ගමන් කරන තිත නම් කරන්න. (ලකුණු - 02)

(ii) එම තිත හා සැසඳෙන උඩරට බෙර මාත්‍රයක් නියමිත තාල සලකුණු සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු - 03)

(iii) ඉහත (ii) හි බෙර පදය හා සමරූපී හින්දුස්තානී තාල පදයක් නම් කර නියමිත තාල සලකුණු යොදා ප්‍රස්තාර කරන්න. (ලකුණු - 04)

(iv) ඉහත දක්වන ලද තාලයට අනුව ගමන් ගන්නා වෙනත් සරල ගීයක ස්ථායී කොටස පද ප්‍රස්තාර කරන්න. (ලකුණු - 03)